(iii) සත්වයන් රැක බලා ගන්නාවූ, පෝෂණය කරන්නා වූ සහ ඔවුන් පුහුණු කිරීමට සම්බන්ධ වන;

(iv) ඉස්සන් ගොවිපළ හෝ ජෙලි (Jelly Fish) ගොවිපොළ ඇතුළුව ජලජ සතුන් හා ශාක ඇති කිරීමට අදාළ වන;

(v) පළිබෝධ නාශක, වල් පැළෑටි නාශක හෝ දිලීරනාශක ඇතුළුව කෘෂි රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, විකිණීම, හැසිරවීම හෝ ප්‍රවාහනයට සම්බන්ධ වන;

(vi) මාළු, මස්, එළවළු හෝ පළතුරු ඇතුළුව ආහාර ද්‍රව්‍ය සකස් කිරීම සඳහා රසායන ද්‍රව්‍ය භාවිතය සහ පළතුරු ඉදවීමට රසායන ද්‍රව්‍ය භාවිත කිරීමට සම්බන්ධ වන;

(vii) මද්‍යසාර හෝ රා නිෂ්පාදනය, ප්‍රවාහනය, හැසිරවීම හෝ විකිණීමට සම්බන්ධ වන;

(viii) දුම්කොළ වගා කිරීම, අස්වැන්න නෙලීම, ඇසිරීම, හැසිරවීම හෝ ප්‍රවාහනයට සම්බන්ධ වන;

(ix) දුම්කොළ නිෂ්පාදන නිපදවීම, ප්‍රවාහනය, හැසිරවීම හෝ විකිණීමට සම්බන්ධ වන;

(x) උපද්‍රවකාරී රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය, හැසිරවීම, ප්‍රවාහනය හෝ බැහැර කිරීමට සම්බන්ධ වන;

(xi) විකිරණශීලී ද්‍රව්‍ය භාවිතය, හැසිරවීම, ප්‍රවාහනය හෝ බැහැර කිරීමට සම්බන්ධ වන;

(xii) ඊයම්, සින්ක්, ආසනික්, රසදිය, ක්‍රෝමියම්, නිකල්, රිදී, කැඩ්මියම් හෝ වෙනත් යම් උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය හෝ සංයුතීන් නිෂ්පාදනය, හැසිරවීම, ප්‍රවාහනය හෝ බැහැර කිරීමට සම්බන්ධ වන;

(xiii) හුණුගල්, සිලිකේට්, ඇස්බැස්ටෝස් හෝ සිමෙන්ති නිෂ්පාදනයට හෝ හැසිරවීමට සම්බන්ධ වන;

(xiv) රූපලාවන්‍යාගාරයක රසායනික ද්‍රව්‍ය හෝ රූපලාවන්‍ය ද්‍රව්‍ය භාවිතයට සම්බන්ධ වන;

(xv) සෞඛ්‍ය ශෝභාගාරයක් (Spa) තුළ;

(xvi) මානසික යහපැවැත්මට හෝ මාර්ගගත ප්‍රවේශයන්ට හානිදායක වන්නාවූ පරිගණක හෝ ඉලෙක්ට්‍රොනික උපකරණවලට අදාළව;

(xvii) සමාජ ශාලාවක්, මත්පැන්හලක් හෝ කැසිනෝ ආයතනයක් තුළ හෝ ඒ ආශ්‍රිතව;

(xviii) පුපුරන ද්‍රව්‍ය හෝ ගිනි අවි නිෂ්පාදනය, ප්‍රවාහනය, හැසිරවීම හෝ විකිණීම පිළිබඳ කටයුතු කරන;

(xix) ක්‍රියාකාරීව පවතින යන්ත්‍රෝපකරණ සහ තියුණු දාර සහිත යන්ත්‍රෝපකරණ භාවිත කිරීම, පිරිසිදු කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ අලුත්වැඩියා කිරීමට සම්බන්ධ වන;

(xx) ඇඹරුම්හල් තුළ හෝ ඒ ආශ්‍රිතව;

(xxi) වාණිජමය ධීවර කටයුතු හෝ ගැඹුරු දියේ ධීවර කටයුතුවලට අදාළ;

(xxii) පිහිනුම් තටාක තුළ හෝ ආශ්‍රිත නඩත්තු කටයුතුවල;

(xxiii) වරායක, තොටුපළක, මුහුදු බොක්කක, අංගනයක, ජැටියක හෝ ගංගා මෝයක් තුළ බර උසුලාගෙන යෑම හෝ ශාරීරිකව තුවාල සිදුවිය හැකි යම් උපකරණ භාවිතයට සම්බන්ධ වන; හෝ

(xxiv) බෝට්ටු ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වන;

(xxv) මගීන් ප්‍රවාහනයට සම්බන්ධ වන;

(xxvi) කිමිදීමට සම්බන්ධ වන;

(xxvii) වගුරු බිම්වල ඇවිද ගොස් මල් නෙලීමට සම්බන්ධ වන;

(xxviii) භූගත ස්ථානයක හෝ ගුහාවල් තුළ;

(xxix) ඉදිකිරීම් කටයුතු මෙහෙයවීමේ කාර්යාලයක් තුළ වූ සැහැල්ලු කාර්යාලීය වැඩකටයුතු හැර ඉදි කිරීමේ වැඩබිම් පරිශ්‍රවල හෝ එය ආශ්‍රිතව;

(xxx) ලෝහ උණු කිරීමට සම්බන්ධ වන;

(xxxi) වීදුරු කර්මාන්තය සඳහා වැලි හැලීමට සම්බන්ධ වන;

(xxxii) වීදුරු උණු කිරීමට හෝ කැපීමට සම්බන්ධ වන;

(xxxiii) අධි වෝල්ටීයතාවයකින් යුතු විදුලි රැහැන් සම්බන්ධ වන;

(xxxiv) *(අ)* මීටර් 1.5ට වඩා උස (සියලුම පැති) යම් ස්ථානයක ආරක්ෂක පියවර සපයා නොමැතිවිට; හෝ
*(ආ)* මීටර් 3ට වඩා උස (සියලුම පැති) යම් ස්ථානයක ආරක්ෂක පියවර සපයා තිබුණද;

කිසියම් පිහිටීමක;

(xxxv) කැළි කසළ හා අපද්‍රව්‍ය රැස් කිරීම, බැහැර කිරීම හෝ ශෝධනය කිරීම හෝ කාණු, ඇල මාර්ග හෝ ජලාපවහන පද්ධති පිරිසිදු කිරීමට සම්බන්ධ වන;

(xxxvi) වෛද්‍ය පරීක්ෂණාගාර හෝ වෛද්‍ය උපකරණ භාවිත කරන ස්ථාන තුළ හෝ ආශ්‍රිතව;

(xxxvii) සායනික හෝ ජෛව අපද්‍රව්‍ය සම්බන්ධ වන;

(xxxviii) සම් පදම් කිරීමට සම්බන්ධ වන;

(xxxix) වනාන්තරයක් තුළ හෝ වෙනත් යම් වැඩ පොළක දර එකතු කිරීම, පැලීම, කපා හෙලීම, දර කුට්ටි කිරීම හා සම්බන්ධ වන;

(xl) ගස්වලට නැගීම හෝ ගස් කපා බිම හෙලීම හා සම්බන්ධ වන;

(xli) *(අ)* යම් බරක්, පුරුෂයින් සම්බන්ධයෙන් කිලෝග්රෑම් 8ට වැඩි බරක් හා ස්ත්‍රීන් සම්බන්ධයෙන් කිලෝග්රෑම් 5ට වැඩි බරක්, මීටර් 50ට වැඩි දුරක් අවම වශයෙන් විනාඩි 3ක වත් විවේකයක් නොමැතිව මිනිත්තු 10ට වැඩි අඛණ්ඩ කාල සීමාවක් සඳහා සහ (විවේකය ද ඇතුළුව) දවසකට පැය 4ට වැඩි සමස්ත කාලසීමාව තුළ එසවීමට, ඔසවාගෙන යාමට හෝ ඉවත් කිරීමට සම්බන්ධ වන; හෝ

(xli) *(ආ)* යම් බරක්, පුරුෂයන් සම්බන්ධයෙන් කිලෝග්රෑම් 8ට වැඩි බරක් හා ස්ත්‍රීන් සම්බන්ධයෙන් කිලෝග්රෑම් 5ට වැඩි බරක්, අවම වශයෙන් විනාඩි 3ක වත් විවේකයක් නොමැතිව මිනිත්තු 10ට වැඩි අඛණ්ඩ කාල සීමාවක් සඳහා සහ (විවේකය ද ඇතුළුව) දවසකට පැය 2ට වැඩි සමස්ත කාලසීමාවක් ද වාහනයකට පැටවීම හෝ වාහනයකින් බෑමට සම්බන්ධ වන;

එසේ වුවද, පුරුෂයන් සම්බන්ධයෙන් වන විටදී බර කිලෝග්රෑම් 10ට වැඩි නොවිය යුතු අතර, ස්ත්‍රීන් සම්බන්ධයෙන් වන විටදී බර කිලෝ ග්රෑම් 7ට වැඩි නොවිය යුතු ය.

(xlii) පිත්තල භාණ්ඩ නිෂ්පාදනය හෝ සිලිකන් වාත්තු කිරීමේ කර්මාන්තයට සම්බන්ධ වන;

(xliii) රතිඤ්ඤා හෝ වෙනත් යම් පුපුරන සුළු ද්‍රව්‍ය නිපදවීමට හෝ විකිණීමට සම්බන්ධ වන;

(xliv) දැවෙන සුළු ද්‍රව්‍යයක් හෝ ගින්දර භාවිතා කරමින් සිදු කරනු ලබන රඟපෑමක් සම්බන්ධ වන;

(xlv) අවන්හලක, ආපනශාලාවක, භෝජනාගාරයක හෝ මත්පැන්හලක මත්පැන් පිළිගැන්වීම සම්බන්ධ වන;

(xlvi) විලක, පොකුණක, ඔයක, ගංගාවක, ජලාශයක, වාප්පුවක ඇලක හෝ වෙරළක හෝ ඒ ආශ්‍රිතව;

(xlvii) පතල් හැරීමේ දී ගල් කැඩීම, ගල් තැලීම හෝ ගල් කැඩීමේ යන්ත්‍රයකට ගල් ගෙනයාම හෝ ඉන් ගෙන ඒම;

(xlviii) තොටුපලක හෝ ඒ ආශ්‍රිතව වැලි ගොඩ දැමීමට සම්බන්ධ වන;

(xlix) වාහනයකට හෝ යාත්‍රාවකට වැලි පැටවීම හෝ වැලි බෑමට සම්බන්ධ වන;

(l) හුණුගල් පෝරණුවක;

(li) පතලක හෝ ගල්වලක;

(lii) වාත්තු වැඩපලක හෝ ලෝහ තැලීමේ ස්ථානයක;

(liii) ගඩොල් හෝ සෙවිලි උළු නිෂ්පාදනය කරන පෝරණුවක;

(liv) මාර්ගෝපදේශකයකු ලෙස සංචාරකයන් සමග සම්බන්ධ වන;

(lv) ගොඩනැගිලි පින්තාරු කිරීමට සම්බන්ධ වන;

(lvi) රෙදිපිළි නිෂ්පාදනයේ පහත දැක්වෙන කාර්යයන්ට සම්බන්ධ වන;

*(අ)* නූල් කැටීම;

*(ආ)* පුළුන් කිරීම;

*(ඇ)* නූල් එතීම;

*(ඈ)* විවීම;

*(ඉ)* ඉටි උණු කිරීම;

*(ඊ)* සායම් මිශ්‍ර කිරීම;

*(උ)* අච්චුවල යෙදීම; සහ

*(ඌ)* ජලය උරා ගැනීමේ යන්ත්‍රවල වැඩ කිරීම යන්නට අදාළ;

(lvii) නිමි ඇඳුම් නිෂ්පාදනයේ පහත දැක්වෙන යම් කටයුතුවලට සම්බන්ධ වන;

*(අ)* ගොඩ ගැසීම;

*(ආ)* පිහියෙන් හෝ අත් පිහියකින් කැපීම; සහ

*(ඇ)* නිමා කිරීම, වියළීම සහ මැදීම;

යන්නට අදාළ;

(lviii) රබර් කිරිවලට රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් රබර් ෂීට් නිපදවීමට සම්බන්ධ වන;

(lix) පුද්ගලයන්ට, දේපලවලට හෝ සතුන්ට ආරක්ෂාව සැපයීමට සම්බන්ධ වන;

(lx) වීදුරු හෝ වීදුරු භාණ්ඩ ඇසුරුම් කිරීම, හැසිරවීම, පැටවීම හෝ බෑමට සම්බන්ධ වන;

(lxi) ටයිල් කැපීමට සම්බන්ධ වන;

(lxii) වඩු කර්මාන්තයේ දී යම් දැවමය උපාංගයක් හෝ ගෘහ භාණ්ඩයක් නිෂ්පාදනය සඳහා ආයුධ භාවිතා කිරීම, පිරිමැදීම හෝ දැව ආරක්ෂණ ඉසීමට සම්බන්ධ වන;

(lxiii) මාර්ග ඉදි කිරීමේ හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා පොළොව මට්ටම් කිරීම, සමතලා කිරීම හෝ තාර දැමීමට සම්බන්ධ වන;

(lxiv) ලුණු අස්වැන්න නෙලීමට, ඇසුරුම් කිරීම, පැටවීම හෝ ප්‍රවාහනයට සම්බන්ධ වන;

(lxv) වෙළඳ ආයතනවල ඉවීම හෝ පිළිස්සීමට (baking) සම්බන්ධ වන;

(lxvi) රට තුළ ජලයෙහි හෝ මුහුදු තිරයෙහි මෙහෙයවන යාත්‍රාවක් තුළ;

(lxvii) සර්කස් හෝ ජිම්නාස්ටික් රඟපෑම්වලට සම්බන්ධ වන හෝ වෙනත් අනතුරුදායක රඟපෑම් හෝ සතුන් හැසිරවීමට අදාළව;

(lxviii) චිත්‍රපටියක, රූපවාහිනී නාට්‍යයක හෝ වෙනත් යම් මුද්‍රිත, සම්ප්‍රේෂිත හෝ ප්‍රකාශිත ද්‍රව්‍යයකට අදාළව සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සදාචාරයට හානිදායක;

(lxix) බර වාහනවල ටයර් මාරු කිරීමට සම්බන්ධ වන;

(lxx) මෘත ශරීරාගාරයක්, අවමංගල්‍ය ශාලාවක හෝ සුසාන භූමියක් තුළ;

(lxxi) යම් තරුණ අයකුගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට හානිදායක විය හැකි;

කිසිදු ආකාරයේ කාර්යයක වයස අවුරුදු දහ අටට අඩු කිසිදු තැනැත්තකු සේවයේ යෙදවීම සිදු නොකළ යුතු ය.

3. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල-

"තැබෑරුම" යන්නට, කැරෝකේ තැබෑරුම ද ඇතුළත් වේ;

"කැසිනෝ" යන්නට, 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ දී ඇති එම අර්ථයම තිබිය යුතු ය;

"සමාජශාලා" යන්නෙන්, 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත යටතේ බලපත්‍ර දෙන ලද සමාජශාලාවක් අදහස් වේ;

"පුපුරන ද්‍රව්‍ය" යන්නට, (183 වන අධිකාරිය වූ) පුපුරන ද්‍රව්‍ය ආඥාපනතේ දී ඇති අර්ථයම තිබිය යුතුය;

"වනාන්තර" යන්නට, (451 වන අධිකාරය වූ) කැළෑ ආඥා පනතේ දී ඇති අර්ථයම තිබිය යුතුය;

"උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය" යන්නෙන්,

(අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හෝ ඒ පනතේ 32 වන වගන්තිය යටතේ වූ යම් නියෝග මගින් තහනම් කර ඇත්තා වූ යම් දියර, ඝන, හෝ වායුමය ද්‍රව්‍යයක් පරිසරයට පිට කිරීම, බැහැර කිරීම හෝ තැන්පත් කිරීම; හෝ

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හෝ ඒ පනතේ 32 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් භාවිතය තහනම් කර ඇත්තා වූ යම් ඉන්ධන;

"පළිබෝධ නාශක" යන්නට, 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"වරාය" යන්නෙන්, 1979 අංක 51 දරන ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ අර්ථානුකූලව නිශ්චිතව සඳහන් කරන ලද වරායක් අදහස් විය යුතු ය;

"විකිරණශීලී ද්‍රව්‍ය" යන්නෙන්, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"දුම්කොළ නිෂ්පාදන" යන්නට, 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"යාත්‍රාව" යන්නට, 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන් සේවයෙහි යෙදවීමේ පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"තරුණ අය" යන්නට, 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන් සේවයෙහි යෙදවීමේ පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

4. නිපුණතා සංවර්ධන කාර්යයන් සඳහා රජයේ හෝ රාජ්‍ය නොවන යම් ආයතනයක හෝ තාක්ෂණික විද්‍යාලයකට සම්බන්ධ ආධුනිකයකු, පුහුණුකරුවකු, අභ්‍යාසලාභියකු වන්නාවූ යම් තැනැත්තකුට මෙම නියෝග අදාළ කර නොගත යුතු ය.

5. 2010 අගෝස්තු මස 20 වැනි දින අංක 1667/41 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද අනතුරුදායක රැකියා නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

11-798

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.